අධ්‍යක්ෂ- සැපයුම්
Director/Supplies
Telephone No : 011-2399141
Fax : 011-2320729
Extension : 3015
E-Mail : dir.supplies@police.lk
සහකාර පොලිස් අධිකාරි- සැපයුම්
ASP/Supplies
Tele/Fax : 011-2324915
Extension : 3110
ස්ථානාධිපති- සැපයුම්
OIC/Supplies
Tele/Fax : 011-2543012
Extension : 3111

# පොලිස් සැපයුම් කොට්ඨාශය
## பொலிஸ் விநியோகப் பிரிவு
## POLICE SUPPLIES DIVISION

පොලිස් මූලස්ථානය, දෙවන මහල, කොළඹ 01, ශ්‍රී ලංකා.
பொலிஸ் தலைமை அலுவலகம், 2 டாம் மாடி கொழும்பு 01, இலங்கை.
POLICE HEADQUARTERS, 2nd FLOOR, COLOMBO 01, SRI LANKA.

මගේ අංකය
My No D/sup/out/184/2
ඔබේ අංකය
Your No }

ගණකාධිකාරි- සැපයුම්
Accountant/Supplies
Tele/Fax : 011-2324729
Extension : 3113
ප්‍රධාන කළමණාකරණ සහකාර
Chief Management Asst:
Extension : 3118
General No: 011-2421111

2022.09.13

අණදෙන නිලධාරි,
පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථානය,
කොළඹ 05.

**තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාවේ අභියාචනා අංක RTIC/Appeal/927/2022, RTIC/Appeal/928/2022 සහ RTIC/Appeal/929/2022 සම්බන්ධව**

සමාජය හා සාමයික කේන්ද්‍රයේ තරිඳු ජයවර්ධන මහතා විසින් පසුගිය දිනවල පැවති උද්ඝෝෂණ විසුරුවා හැරීම සඳහා ශ්‍රී ලංකා පොලිසිය විසින් කඳුළු වායු උණ්ඩ භාවිතා කිරීම සම්බන්ධයෙන් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 25 (3) අනුව ඇමුණුම 01 හි සඳහන් තොරතුරු ඉල්ලුම් කර ඇත.

ඒ අනුව ඉහත අභියාචනා 03 සඳහා එකම තොරතුරු ඉල්ලා ඇති බැවින් ඉල්ලුම් කරන ලද තොරතුරු, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාවේ උපදෙස් හා නිර්දේශ අනුව අංක 01 සිට 07 දක්වා තොරතුරු සැපයුම් කොට්ඨාශය සතුව ඇති බැවින් එම තොරතුරු ලබාදීමට කටයුතු කරන ලදී.

ඔබ වෙත RTIC/Appeal/928/2022 අනුව කර ඇති අභියාචනයට අදාල තොරතුරුඅතරින් අංක 01 සිට 07 දක්වා තොරතුරු ලබාදී ඇති අතර, අංක 08 සිට 14 දක්වා තොරතුරු ඔබ සතුව පවතීනම්, එම තොරතුරු, තොරතුරු දැනගැනීමේ පනතට අනුව ලබාදීමට කටයුතු කරන ලෙස දන්වා සිටිමි.

**අධ්‍යක්ෂ/ සැපයුම්**

පිටපත - තරිඳු ජයවර්ධන මහතා - සමාජය හා සාමයික කේන්ද්‍රය, නො.281, ඩීන්ස් පාර, කොළඹ 10.

ගොනුවට

RTIC/927
Colombo - 07.

# URGENT RTI

1 message

**Tharindu Jayawardhana** <tharindu.rti@gmail.com>
To: dir.supplies@police.lk
Cc: CSR RTI <csr.rti281@gmail.com>

17 July 2022 at 16:5

තොරතුරු නිලධාරී,
පොලිස් සැපයුම් කොට්ඨාසය.

මේ දිනවල පවත්වන විරෝධතා විසිරුවීමට දිගින් දිගටම කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කරන අතර එම නිසා බොහෝ පිරිසක් රෝගාතුර වී සිටිති. මේ හේතුවෙන් තොරතුරු පනතේ 25(3) යටතේ පහත දැක්වෙන තොරතුරු ලබා දෙන ලෙස ඉල්ලා සිටිමු.

ඉල්ලා සිටින තොරතුරු -

2010 ජනවාරි 1 වන දින සිට 2022 ජනවාරි 1 වන දක්වා කාලය තුළ,

1) ලංකාවට ගෙන්වා ඇති ක දුළු ගෑස් ප්‍රමාණය කොපමණද?

2) ලංකාවට අවස්ථා කීයකදී කඳුළු ගෑස් ගෙන්වා තිබේද?

4) එම එක් එක් අවස්ථාවේදී වියදම් වූ මුදල් ප්‍රමාණයන් වෙන් වෙන්ව කොපමණක් ද?

5) එලෙස කඳුළු ගෑස් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා දුන් ලේඛන මොනවාද? එලෙස කඳුළු ගෑස් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවූ ලේඛන වල සහතික පිටපත් ලබා දෙන්න.

6) එම සෑම අවස්ථාවකටම අදාළ තාක්ෂණික ඇගයුම් කමිටු වාර්තා වල සහතික පිටපත් ලබා දෙන්න.

7) එම සෑම අවස්ථාවකටම අදාළ ටෙන්ඩර් ප්‍රධානය කළ ලිපි වල සහතික පිටපත් ලබා දෙන්න.

8) මෙම තොරතුරු ඉල්ලීමට පාදක වන කාලසීමාවේදී කඳුළුගෑස් භාවිත කළ ප්‍රමාණය වාර්ෂිකව ලබා දෙන්න.

9) පසුගිය දිනවල කල් ඉකුත් වූ කඳුළු ගෑස් පොමණ ප්‍රවමාණයක් භාවිත කළේද?

10) එලෙස භාවිත කිරීමට හේතුව කුමක්ද?

11) කල් ඉකුත් වූ කඳුළු ගෑස් භාවිත කිරීමට අවසර ගත්තේ කාගෙන්ද? ඊට අදාල ලේඛණවල සහතික පිටපත් ලබා දෙන්න.

12) 2022 මාර්තු 31 සිට 2022 ජූලි 17 තෙක් කඳුළු ගෑස් ප්‍රහාර අවස්ථා කොපමණ ප්‍රමාණයකදී එල්ල කර තිබේද?

13) එලෙස එල්ල කළ අවස්ථාවලදී භාවිත කරන ලද කඳුළු ගෑස් ප්‍රමාණයන් මොනවාද? ඒ බව සඳහන්වන ලේඛනවල සහතික පිටපත් ලබා දෙන්න.

14) එම අවස්ථාවලදී භාවිත කළ කඳුළු ගෑස් කුමන වසරවල මිලදී ගත් කඳුළු ගෑස්ද? ඊට අදාල සියලු ලේඛනවල සහතික පිටපත් ලබා දෙන්න.

ස්තුතියි.

තරිඳු ජයවර්ධන
සමාජය සහ සාමයික කේන්ද්‍රය (සීඑස්ආර්)
0710661417
csr.rti281@gmail.com
tharindu.rti@gmail.com

RTIC/832/2
Duplicate with RTIC/833/2

RTI/CSR/0068

D/sup/out/6842/2022

අධ්‍යක්ෂ - සැපයුම්
සැපයුම් කොට්ඨාශය
පොලිස් මූලස්ථානය
කොළඹ 01.

ශිරිදු ජයවර්ධන මහතා,
සමාජය හා සාමයික කේන්ද්‍රය,
නො. 281,
ඩීන්ස් පාර,
කොළඹ - 10.